016

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2022/2023
අවසාන පරීක්ෂණය - 2023
**SNP8245** - විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා පන්ති කළමනාකරණය
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.12.16 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (03) පිළිතුරු සපයන්න.**

## <u>1 වන කොටස</u>

01. පන්තිකාමර කළමනාකරණය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? පිළිගත් අර්ථ දැක්වීමක් සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න.

02. අන්තර්කරණ ඉගෙනුම් පරිසරය (Inclusive Learning Environment) තුළ ගුරුවරයෙකු සඳහා පන්තිකාමර කළමනාකරණයේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ඵලදායී පන්තිකාමර කළමනාකරණය සඳහා සැලසුම් කිරීම සංකීර්ණ ක්‍රියාවලියකි. ගුරුවරයෙකු විසින් ඵලදායී පන්තිකාමර කළමනාකරණයක් සැලසුම් කිරීම සඳහා සලකා බැලිය යුතු අංග පහක් (05) සඳහන් කරන්න.

04. ඵලදායී පන්තිකාමර කළමනාකරණය සඳහා අවශ්‍ය මූලිකාංග පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

05. පන්තිකාමර කළමනාකරණයේ දී ගුරුවරුන් විසින් සිදුකරන වැරදි මොනවා ද?

06. "වර්තමානයේ බොහෝ පන්තිකාමර විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සහ සාමාන්‍ය අධ්‍යාපන සිසුන්ගේ සම්මිශ්‍රණයකින් සමන්විත පන්තිකාමර වේ." සියලුම සිසුන් සඳහා ඵලදායී ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමට ගුරුවරයෙකුට භාවිතා කළ හැකි පන්තිකාමර කළමනාකරණ උපාය මාර්ග පහක් (05) ලැයිස්තුගත කරන්න.

07. අන්තර්කරණ ඉගෙනුම් පරිසරයක් තුළ ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර යෝග්‍ය සමීපත්වය (Appropriate Proximity) ගොඩනැගීම වඩා හොඳ පන්තිකාමර කළමනාකරණයකට මග පාදයි.

    සුදුසු උදාහරණ සමඟ මෙම ප්‍රකාශය සාධාරණීකරණය කරන්න.

08. අන්තර්කරණ ඉගෙනුම් පරිසරයක් තුළ සියලුම සිසුන් කාර්යයක් කෙරෙහි අවධානය යොමු කර තබා ගැනීම (focused on task) ගුරුවරයෙකුට අභියෝගයකි. සියලු සිසුන් කාර්යයක් කෙරෙහි අවධානය යොමු කිරීමට ගුරුවරයෙකුට භාවිත කළ හැකි උපාය මාර්ග පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. "ඵලදායී පන්තිකාමර කළමනාකරණය යටතේ සිසුන්ගේ චිත්තවේගීය හා චර්යා කළමනාකරණය ඉතා වැදගත් වේ."

(i) චිත්තවේගීය සහ චර්යාත්මක ආබාධ යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) විශේෂ අධ්‍යාපන පසුබිමක ශිෂ්‍යයාගේ ධනාත්මක හැසිරීමට සහාය වීම සඳහා ගුරුවරයෙකුට භාවිතා කළ හැකි ශිල්පීය ක්‍රම දෙකක් (02) සඳහන් කර ඒවායින් එකක් (01) විස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) අන්තර්කරණ පන්තිකාමරයක චිත්තවේගීය චර්යා ආබාධ (EBD) ඇති සිසුන්ට උපකාර කිරීම සඳහා ගුරුවරයෙකු ලෙස ඔබට භාවිත කළහැකි ඵලදායී උපාය මාර්ග තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

10. "ඕනෑම පන්ති කාමරයක් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා සිසුන් අතර ඉගෙනීමේ ස්වයං-නියාමනය වර්ධනය කිරීම ඉතා වැදගත් වේ."

(i) ස්වයං-නියාමන ඉගෙනීම (Self-regulated Learning) යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) සිසුන්ට ඉගෙනීමේ දී ස්වයං-නියාමනයේ වැදගත්කම උදාහරණ සමඟින් කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) සිසුන්ට ඵලදායී ස්වයං-නියාමනයකට සහාය වීම සඳහා ගුරුවරයෙකු ලෙස ඔබට භාවිතා කළ හැකි ඕනෑම උපාය මාර්ග තුනක් (03) හඳුනාගෙන ඒවායින් එකක් (01) අන්තර්කරණ පන්තිකාමර පරිසරයක් තුළ උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

11. "පන්තිකාමර කළමනාකරණ සන්දර්භය යටතේ, සිසුන් සමග ශක්තිමත් සබඳතා ගොඩනගා ගැනීම (Building strong relationships) ඔවුන්ට අධ්‍යාපනික හා සමාජීය වශයෙන් දියුණු වීමට උපකාරී වේ."

(i) සබඳතා ගොඩනැගීම පන්තිකාමර කළමනාකරණයේ ප්‍රධාන සාධකයක් ලෙස සලකන්නේ ඇයි? (ලකුණු 04)

(ii) සිසුන් සමග ධනාත්මක සබඳතා ගොඩනගා ගැනීම සඳහා ගුරුවරයෙකුට යෙදිය හැකි සරල ශිල්පීය ක්‍රම හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) අන්තර්කරණ පන්තිකාමරයක සිසුන් සමඟ සබඳතා ගොඩනගා ගැනීමේ දී ගුරුවරයෙකුට මුහුණ දිය හැකි අභියෝග දෙකක් (02) හඳුනාගෙන එම අභියෝග ජය ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

12. "ඵලදායී අන්තර්කරණ පන්තිකාමරයක් නිර්මාණය කිරීම සඳහා ගුරුවරයෙකු විසින් සිසුන්ගේ සමාජ කුසලතා (Social Skills) සංවර්ධනයට සහාය වීම අත්‍යවශ්‍ය වේ."

(i) සමාජ කුසලතා යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) අන්තර්කරණ පන්තිකාමර පසුබිමක සමාජ කුසලතා සංවර්ධනය කිරීම වැදගත් වන්නේ මන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ගුරුවරයෙකුට ඔහුගේ/ඇයගේ සිසුන්ගේ සමාජ කුසලතා සංවර්ධනයට උපකාර කිරීම සඳහා භාවිතා කළ හැකි ඕනෑම උපාය මාර්ග හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. පන්තිකාමර කළමනාකරණ සන්දර්භය තුළ, ධනාත්මක, ඵලදායී ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සිසුන්ගේ අධ්‍යාපනික, චිත්තවේගීය සහ සමාජීය සාර්ථකත්වය සඳහා ප්‍රධාන වේ.

(i) ධනාත්මක ඉගෙනුම් පරිසරයක් (Positive learning environment) යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) අන්තර්කරණ පන්තිකාමරයක් තුළ ධනාත්මක ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම විශේෂයෙන් වැදගත් වන්නේ ඇයි? (ලකුණු 08)

(iii) ධනාත්මක ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ගුරුවරයෙකුට භාවිතා කළ හැකි ඕනෑම උපාය මාර්ග හතරක් (04) හඳුනාගෙන එක් (01) උපාය මාර්ගයක් උදාහරණ සමඟ විස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 08)

14. "පන්තිකාමර කළමනාකරණය ඉගැන්වීමේ හදවතයි එය ඔබේ ශිෂ්‍යයාගේ ඉගෙනුම් ප්‍රතිඵලවලට බලපාන අතර ගුරුවරුන්ගේ යහපැවැත්ම කෙරෙහි ද බලපෑමක් ඇති කළ හැකි ය."

(i) "ඵලදායී පන්තිකාමර කළමනාකරණය" සහ "දුර්වල පන්තිකාමර කළමනාකරණය" අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) පන්තිකාමර කළමනාකරණයට මූලික කුළුණු (Core pillars) හතරේ (04) බලපෑම කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) ඵලදායී පන්තිකාමර කළමනාකරණ සැලැස්මක් (Classroom management plan) සකස් කිරීමේ දී ගුරුවරයෙකු විසින් සලකා බැලිය යුතු කොන්දේසි හතරක් (04) හඳුනාගෙන, එක් (01) කොන්දේසියක් විස්තරාත්මක ව උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.